# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/34 - 2021 නොවැම්බර් මස 03 වැනි බදාදා - 2021.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**04 වන සංශෝධනය**

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2018 දෙසැම්බර් මස 24 දිනැති අංක 2103/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ඔක්තෝබර් මස 27 වැනි දින,

I කොටස

සංශෝධන අංක 01 - 2019 ඔක්තෝබර් මස 04 දිනැති හා අංක 2143/52 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2020 ජනවාරි මස 23 දිනැති හා අංක 2159/36 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2021 ජූනි මස 30 දිනැති හා අංක 2234/25 *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 35276 — 15 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

18.1 අන්තර් කාලය තුළ දී මෙම සේවා ව්‍යවස්ථාවේ 10.2.1 හි (V) හෝ 10.3.1 හි (I) හි සඳහන් සුදුසුකම්වලට විකල්ප සුදුසුකම් ලෙස මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය විසින් පවත්වන මැනුම් විද්‍යාව පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව හෝ මැනුම් විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ මේ හා සමාන හෝ ඉන් ඉහළ මැනුම් විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් හෝ පිළිගනු ලැබේ.

සටහන

1. ඉහත සුදුසුකම් අනුව විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරියෙකු සර්වේයර් ජනරාල්වරයා සමග ගිවිස ගන්නා විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වන ලිඛිත නිබන්ධනයක් සර්වේයර් ජනරාල්වරයා විසින් පත් කරනු ලබන කමිටුවක් වෙත ඉදිරිපත් කළ යුතුය. මේ යටතේ ලිඛිත නිබන්ධනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනුයේ, අන්තර්කාලීන විධිවිධාන ක්‍රියාත්මක වීම අවසන් වන 2023.12.24 දිනය දක්වා පමණි.

2. ඉහත 1 හි පරිදි ලිඛිත නිබන්ධනයක් ඉදිරිපත් කර අදාළ කමිටුවේ අනුමැතිය ලබා ගන්නා තෙක් 18.1 යටතේ වන සුදුසුකම් අනුව විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබාදීම තාවකාලිකව අත්හිටවනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.